ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2513/35 - 2026 නොවැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2026.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

එල්.ඩී.-බී. 1/98 (II)(අ)

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත

25 වන වගන්තිය යටතේ වන නියමය

(2වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු, 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 25 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය, සුනිල් හඳුන්නෙත්ති වන මා විසින්, පහත පරිදි මෙයින් නියම කරනු ලැබේ :-

01. මේ නියමය, 2026 ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සංස්ථාගත කිරීමට අදාළ නියමය අවලංගු කිරීමේ) නියමය යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 ජූලි මස 28 වන දින අංක 882 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පිහිටුවන ලද මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සතු කරන ලද, දරන ලද හෝ එයට සම්බන්ධ සියලු චංචල හා නිශ්චල දේපළ, අයිතිවාසිකම්, සම්බන්ධතා, වරප්‍රසාද, බැරකම් සහ බැඳියාවන් (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙත පවරා සතු කරනු ලැබිය යුතු ය.

03. ආයතනය පාර්ශ්වයක් වන, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම් හෝ වෙනත් සාධන පත්‍ර නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය විසින් එළඹෙන ලද කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයක් බවට සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

04. ආයතනය විසින් හෝ ආයතනයට එරෙහිව නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවත්නා යම් නඩුවක්, නඩු කටයුත්තක් හා කාරණයක් අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව නොකඩවා පවත්වාගෙන යාමට හා බලාත්මක කිරීමට හැකි ය.

1A - G 48500 — 04 (2026/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරය දරනු ලබන, ආයතනයේ සෑම නිලධරයකු, සේවකයකු හෝ සේවානියුක්තකයකු විසින්, නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, නියමිත දිනයට පෙරාතුව ම ඔහුට අදාළ වන නියම හා කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අධිකාරියේ නිලධරයකු, සේවකයකු හෝ සේවානියුක්තිකයකු වන බවට සලකනු ලැබිය යුතු අතර සේවා, නිවාඩු සහ විශ්‍රාම ප්‍රතිලාභ සම්බන්ධයෙන් උපචිත වන සියලු අයිතිවාසිකම් සුරක්ෂිත කරනු ලැබිය යුතු ය.

06. නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයට අයත් වන හෝ ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන සියලු වාර්තා, ලේඛන, පොත්, ගිණුම්, ලේඛන සහ වෙනත් දේපළ, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය යුතු ය.

07. ආයතනය විසින් ආරම්භ කරන ලද, පවත්වන ලද හෝ ප්‍රදානය කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා යම් පාඨමාලාවක්, පුහුණු වැඩසටහනක්, විභාගයක්, සහතික කිරීමක්, පර්යේෂණ ව්‍යාපෘතියක්, අනුමතයක්, ප්‍රතීතනයක් හෝ වෙනත් ක්‍රියාකාරකමක්, නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, අධිකාරිය විසින් ආරම්භ කරනු ලැබුවා සේ, පවත්වාගෙන යනු ලැබුවා සේ හෝ ප්‍රදානය කරනු ලැබුවා සේ සැලකිය යුතු අතර ඒ අනුව අඛණ්ඩව පවත්වාගෙන යාම, සම්පූර්ණ කිරීම, බලාත්මක කිරීම හෝ පිළිගැනීම සිදු කරනු ලැබිය හැකිය.

08. ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවක හෝ වැඩසටහනක, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු, නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි, අධිකාරිය විසින් පවත්වනු ලබන ඊට අනුරූපවන්නා වූ පාඨමාලාවේ හෝ වැඩසටහනේ ලියාපදිංචි වන බවට සැලකිය යුතු අතර එම ලියාපදිංචි වීමට අදාළ සියලු අයිතිවාසිකම් සහ බැඳියාවන් සුරක්ෂිත කරනු ලැබිය යුතු ය.

09. ආයතනය විසින් නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද සහ ඒ දිනයේ දී වලංගු පවතින යම් සහතිකයක්, සුදුසුකමක්, අනුමතයක් හෝ ප්‍රතීතනයක් නියමිත දිනයේ දී හෝ ඊට පසුව අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද හෝ නිකුත් කරන ලද ලෙස අඛණ්ඩව වලංගු විය යුතු ය.

10. නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ යම් කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක්, බලපත්‍රයක්, අවසර පත්‍රයක්, සහතිකයක්, අනුමතයක්, ප්‍රතීතනයක්, වාර්තාවක් හෝ වෙනත් ලිපියක් තුළ ඇති ආයතනය පිළිබඳ යම් යොමුවක්, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, අධිකාරිය පිළිබඳ යොමුවක් ලෙස වටහා ගනු ලැබිය යුතු ය.

11. ආයතනය පිහිටුවමින් 1995 ජූලි මස 28 වන දින අංක 882 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අතර නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි ආයතනය විසුරුවා හරිනු ලැබිය යුතු ය.

සුනිල් හඳුන්නෙත්ති,
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව අමාත්‍ය.

2026 ඔක්තෝබර් මස 26 වන දින,
කොළඹ දී ය.

EOG 11 - 0039